# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2097/33 - 2018 නොවැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2018.11.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය :* KEG/LAN/AQUIS/A3/1/112.

කෑගල්ල බස් ඩිපෝව පුනස්ථාපන ඇළ මාර්ගය සංවර්ධනය සඳහා අවශ්‍ය අමුණා ඇති උපලේඛණයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 53 සී වල්දෙනිය ග්‍රාම නිලධාරී වසමේ (කෑගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ) පිහිටි කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක මු.පි.කෑ. 3606 අංක දරන පිඹුරේ අමුණා ඇති උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 02ක් වේ;

**උපලේඛනය**

*මු.පි.කෑ. 3606 පිඹුර*

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: *ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර;* හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : ඩබ්.ඒ. ප්‍රේමවතී, අංක 172 පිස්කල් වත්ත, පරගම්මන; ප්‍රමාණය: හෙක්. 0.0073.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: *ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර;* හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය : ඩබ්.ඒ. ප්‍රේමවතී, අංක 172 පිස්කල් වත්ත, පරගම්මන; ප්‍රමාණය: හෙක්. 0.0092.

*පරීක්ෂණ දින :*

කැ.අංක 01-02 දක්වා 2018 දෙසැම්බර් මස 27 වෙනි දින පෙ.ව. 9.30 සිට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වේලාවන්හිදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2018 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ.ජී.එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කරගැනීමේ නිලධාරී,
කෑගල්ල.

2018 නොවැම්බර් මස 12 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

11 - 1291

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.